# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.25 පැය 1150 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1883 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මහවිලච්චිය පොලිස් ස්ථානය.**

2024.12.24 වන දින උදෑසන කාලයේ මහවිලච්චිය පොලිස් වසමේ දකුණු ඉවුර පේමඩුව ප්‍රදේශයේදී මහවිලච්චිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන පේමඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහවිලච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹුල්ල පොලිස් ස්ථානය.**

2024.12.24 වන දින සවස් කාලයේ දඹුල්ල පොලිස් වසමේ පල්ලේගම ජනපදය ප්‍රදේශයේදී දඹුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන පල්ලේගම ජනපදය, දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දඹුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - මාදම්පිටිය පොලිස් ස්ථානය.**

2024.12.24 වන දින රාත්‍රී කාලයේ මාදම්පිටිය පොලිස් වසමේ රන්මුතු සෙවන මහල් නිවාසයේ දී මාදම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 03 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 650 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 450 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 350 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 හා 25 වයස්වල පසුවන මෝදර, කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මාදම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය